සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, උපාලි යන කුමාරවරු දේවදත්ත කුමරු සමඟ පැවිදි වූයේ,
    1. අනුපිය අඹ වනයේ දී ය.
    2. ජීවක අඹ වනයේ දී ය.
    3. ලුම්බිණි සල් උයනේ දී ය.
    4. ජේතවන උයනේ දී ය.

02. පැවිදි වී සතර පද ගාථාවක් කටපාඩම් කිරීමට මාස හතරක් උත්සාහ කළ ද මතක තබා ගැනීමට නොහැකි වූ භික්ෂූන් වහන්සේ වූයේ,
    1. මහාපන්ථක තෙරුන් වහන්සේ ය.
    2. ආනන්ද තෙරුන් වහන්සේ ය.
    3. ධම්මාරාම තෙරුන් වහන්සේ ය.
    4. චුල්ලපන්ථක තෙරුන් වහන්සේ ය.

03. රාජ පූජිත සෝණදණ්ඩ නම් බමුණා බුදුරජාණන් වහන්සේ සතු ගුණාංග අගය කළ අතර, එහිදී බුදුරජාණන් වහන්සේ '**පුබ්බභාසී**' යනුවෙන් හැඳින්වීමට හේතු වූයේ,
    1. කනට සුව එළවන කථාබහ කරන නිසා ය.
    2. විවෘත කථාබහ ඇති නිසා ය.
    3. පළමුවෙන් ම කථාබහ කරන නිසා ය.
    4. සතුටුසාමීචි කථාබහ කරන නිසා ය.

04. බුද්ධ රත්නයේ, ධම්ම රත්නයේ හා සංඝ රත්නයේ ගුණ ගණනින් විසි හතරකි. එම ගුණ බෙදී යන නිවැරදි පිළිවෙළ සහිත පිළිතුර වන්නේ,
    1. බුදු ගුණ 9, දහම් ගුණ 6, සඟ ගුණ 9
    2. බුදු ගුණ 6, දහම් ගුණ 9, සඟ ගුණ 9
    3. බුදු ගුණ 9, දහම් ගුණ 9, සඟ ගුණ 6
    4. බුදු ගුණ 6, දහම් ගුණ 6, සඟ ගුණ 9

05. තෙරුවන් ගුණ ඇතුළත් ගාථා තුනක් සිහි කරමින් ගමන් කරන විට සොරු කණ්ඩායමකට හසුව මරණයට පත්වී දෙව්ලොව උපත ලැබුවේ,
    1. ඡත්ත නම් තරුණයා ය.
    2. සිගාලක නම් තරුණයා ය.
    3. සුභ නම් තරුණයා ය.
    4. මට්ටකුණ්ඩලී නම් තරුණයා ය.

06. බුදුරජාණන් වහන්සේ විසින් තම ශ්‍රාවකයන් වහන්සේලාට නිවන් අවබෝධය පහසු කරනු පිණිස පනවා වදාළ විනය පිටකයේ උසස් ආචාර ධර්ම පද්ධතිය හඳුන්වන්නේ,
    1. සතර බ්‍රහ්ම විහරණ නමිනි.
    2. සතර සංග්‍රහ වස්තු නමිනි.
    3. සේඛියා නමිනි.
    4. දසසිල් නමිනි.

07. **'අදින්නාදානා වේරමණී......'** යනාදී වශයෙන් දැක්වෙන ශික්ෂාපදය බිඳී යාමට බලපාන ආකාර බොහෝ ගණනක් ඇත. එසේ බලපෑමට ලක් **නොවන** කරුණක් වන්නේ,
    1. වස්තු හිමියාගෙන් උදුරා ගැනීම යි.
    2. ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කොට නඩු කියා ගැනීම යි.
    3. බලහත්කාරයෙන් ඉඩම් පවරා ගැනීම යි.
    4. වස්තු හිමියාගේ මිත්‍රත්වය සලකාගෙන ගැනීම යි.

08. බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය ප්‍රකට කෙරෙන ජාතක කතාවකට උදාහරණයක් වන්නේ,
    1. වෙස්සන්තර ජාතකය යි.
    2. උම්මග්ග ජාතකය යි.
    3. ඎාන්තිවාදී ජාතකය යි.
    4. තිත්තිර ජාතකය යි.

09. බුදු දහමේ ඉගැන්වෙන සහජීවන ගුණය මනාව ප්‍රකට කරමින් ආගම් භේදයකින් තොරව අතීතයේ මෙන් ම වර්තමානයේ ද වැඳපුදා ගන්නා ආගමික ස්ථානයක් වන්නේ,

1. කැලණිය රජමහා විහාරය යි.
2. ශ්‍රී පාදස්ථානය යි.
3. ජය ශ්‍රී මහා බෝධිය යි.
4. නාගදීප විහාරය යි.

10. බුදු දහමට අනුව තෘෂ්ණාව තුන් ආකාරයකට බෙදේ. තෘෂ්ණාව සම්බන්ධ ව සඳහන් වැරදි ප්‍රකාශයක් වන්නේ,

1. පංච ඉන්ද්‍රියයන් පිනවීමට ඇති ආශාව කාම තණ්හාව යි.
2. නැවත නැවත සසර ඉපදීමට ඇති ආශාව භව තණ්හාව යි.
3. පරලොවත් ඇතැයි යන විශ්වාසයෙන් කටයුතු කිරීම විභව තණ්හාව යි.
4. පරලොවක් නැතැයි සිතා හැකිතාක් කම් සැප විඳීම විභව තණ්හාව යි.

11. සසර පුරුද්දට වසලවාදයෙන් අනුන් හෙළා දකිමින් මිනිසුන්ට ආමන්ත්‍රණය කළ මහරහතන් වහන්සේ වූයේ,

1. පිළින්දවච්ඡ මහරහතන් වහන්සේ ය.
2. ආනන්ද මහරහතන් වහන්සේ ය.
3. සීවලී මහරහතන් වහන්සේ ය.
4. බක්කුල මහරහතන් වහන්සේ ය.

12. **'කරන කලට පව් මීරිය මී සේ'** යන උපදේශාත්මක කවිය ඇතුළත් කෘතිය වන්නේ,

1. බුදුගුණාලංකාරය යි.
2. ලෝවැඩ සඟරාව යි.
3. ලෝකෝපකාරය යි.
4. සුභාෂිතය යි.

13. බෝසතාණන් වහන්සේ අජපාල නුගරුක මුල වැඩ සිටිය දී උන්වහන්සේට කිරිපිඬු දානය පූජා කළේ,

1. විශාඛා සිටු දේවිය යි.
2. මල්ලිකා බිසව යි.
3. සුමනා සිටු දේවිය යි.
4. සුජාතා සිටු දේවිය යි.

14. බුදු දහමට අනුව ධනය ඉපයීම කළ යුත්තේ ධාර්මික අයුරිනි. එවැනි ධාර්මික ව කළ හැකි රැකියා ද බුදු දහමේ උගන්වා ඇත. එවන් රැකියා අතරට අයත් **නොවන** රැකියාවක් වන්නේ,

1. කෘෂි කර්මාන්තය යි.
2. මුදල් පොලියට දීම යි.
3. රාජ්‍ය සේවය යි.
4. ගව රක්ෂණය යි.

15. මංගල කරුණු මොනවා දැයි පැහැදිලි කෙරෙන මහා මංගල සූත්‍රයෙහි එන නිදාන කතාවට අනුව 'දිවෙන් රස විඳින, කයෙන් ස්පර්ශ කරන, නාසයෙන් ආඝ්‍රාණය කරන සුභ දේවල්' මංගල කාරණා යැයි ප්‍රකාශ කළ පිරිස හැඳින්වූයේ,

1. දිට්ඨ මංගලිකයන් නමිනි.
2. සුත මංගලිකයන් නමිනි.
3. මුත මංගලිකයන් නමිනි.
4. කෘත මංගලිකයන් නමිනි.

16. බුදුරජාණන් වහන්සේ විසින් අනේපිඬු සිටුතුමාට ගිහියන් විසින් උපදවාගත යුතු සැප හතරක් පිළිබඳ ව දේශනා කරන ලදි. එම දේශනාව ඇතුළත් සූත්‍රය වන්නේ,

1. දම්සක් පැවතුම් සූත්‍රය යි.
2. පරාභව සූත්‍රය යි.
3. සිගාලෝවාද සූත්‍රය යි.
4. අනණ සූත්‍රය යි.

17. රහසින්වත් පව් නොකළ හෙයින් ද, සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් ද, සියලු ලෝවැසියන්ගේ ආමිස හා ප්‍රතිපත්ති පූජාවන් විඳීමට සුදුසු වූ හෙයින් ද බුදුරජාණන් වහන්සේ,

1. 'අරහං' නම් වන සේක.
2. 'සම්මා සම්බුද්ධ' නම් වන සේක.
3. 'සුගත' නම් වන සේක.
4. 'ලෝකවිදූ' නම් වන සේක.

18. මහා මංගල සූත්‍රයේ දී මංගල කරුණු තිස් අටක් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද අතර එහි ළමා කාලයට ඉතා වැදගත් මංගල කරුණක් වන්නේ,

1. 'සුසික්ඛිතෝ' යන්නයි.
2. 'ඤාතකානඤ්ච සංගහෝ' යන්නයි.
3. 'පුත්තදාරස්ස සංගහෝ' යන්නයි.
4. 'මජ්ජපානා ච සඤ්ඤමෝ' යන්නයි.

19. උපතිස්ස හා කෝලිත දෙදෙනා නැරඹූ '**ගිරග්ගසමජ්ජ**' යනු,

1. විවාහ මංගල්‍යයකි.
2. සැණකෙළියකි.
3. රාජාභිෂේකයකි.
4. යාග හෝමයකි.

20. බුදුරජාණන් වහන්සේගේ අතීත ජන්මයන් පිළිබඳ තොරතුරු ඇතුළත් සිංහල '**පන්සිය පනස් ජාතක පොත් වහන්සේ**' රචනා කරන ලද්දේ,

1. අනුරාධපුර යුගයේ දී ය.
2. පොළොන්නරු යුගයේ දී ය.
3. කුරුණෑගල යුගයේ දී ය.
4. කෝට්ටේ යුගයේ දී ය. (ලකුණු 2x20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. තෙවන වාරයේ බුද්ධ ධර්මය විෂයට සමගාමී ව පාසල් පාදක තක්සේරුව සඳහා ඔබ විසින් සිදුකරන ලද ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. මෙම ඇගයීමට අදාළ ව තෙවන වාරයට නියමිත ඔබ යොදාගත් පාඩමේ නම කුමක් ද?

ii. ඇගයීම සිදු කිරීමට පෙර ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.

iii. ඔබ විසින් බිත්ති පුවත්පතට ලියන ලද ලිපියෙහි මාතෘකාව කුමක් ද ?

iv. ඔබ ලිපිය ලිවීමට තොරතුරු එකතු කරගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

v. මෙම ඇගයීම සිදු කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.

vi. මෙම ඇගයීම සිදු කිරීමෙන් ඔබ දියුණු කරගත් කුසලතා දෙකක් ලියන්න.

vii. මෙම පාඩමට යොදාගෙන ඇති සංවාදය ඇතුළත් සූත්‍රයේ නම කුමක් ද?

viii. කොසොල් රජතුමාගේ අග බිසවගේ නම කුමක් ද?

ix. අන් අයගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඔබට කළ හැකි යහපත් කටයුතු දෙකක් ලියන්න.

x. බුදු දහමේ ඉගැන්වෙන '**අත්තුපනායික ධර්මය**' යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 2 x 10 = 20)

02. i. යස්ස පාපං කතං කම්මං - කුසලේන පිථීයති... යන ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. ඉහත ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 03)

iii. යහපත් ශිෂ්‍යයෙකු වීමට අනුගමනය කළ යුතු පුරුදු 05 ක් ලියන්න. (ලකුණු 05)

03. i. සිරිත් හා විරිත් යන වචනවල තේරුම ලියන්න. (ලකුණු 02)

ii. බෞද්ධ සිරිත් විරිත් ඉටු කරන අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ඔබ ඉහත නම් කළ එක් අවස්ථාවක ඉටු කරන චාරිත්‍ර වාරිත්‍ර මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 05)

04. i. බුදුරජාණන් වහන්සේ සදිසා නමස්කාරය දේශනා කළ සූත්‍රය කුමක් ද? එසේ දේශනා කළේ කාට ද? (ලකුණු 02)

ii. එම සූත්‍රයේ දැක්වෙන ආකාරයට ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළ යුතු යුතුකම් 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. යහපත් මිතුරකු තුළ දැකිය හැකි ලක්ෂණ 05 ක් ලියන්න. (ලකුණු 05)

05. i. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව ඇතුළත් සූත්‍රය කුමක් ද? (ලකුණු 02)

ii. එම සූත්‍රයේ සඳහන් අට වැදෑරුම් දුක්වලින් 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. ඔබ ඉහත නම් කළ දුක්වලින් එක් අවස්ථාවක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරය ආදාහනය කිරීමෙන් පසු ඉතිරි වූ සතර දළඳා වහන්සේලා තැන්පත් කෙරුණු ස්ථාන 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. දළඳා වහන්සේ වෙනුවෙන් පැවැත්වෙන පූජා ඒවා පැවැත්වෙන කාලය අනුව ප්‍රධාන ආකාර තුනකි. ඒ මොනවා ද? (ලකුණු 03)

iii. ලක්දිවට දළඳා වහන්සේ වැඩම කිරීමේ කතා පුවත කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකාවලින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

i. බුදුරජාණන් වහන්සේගේ ආගන්තුක සත්කාරය

ii. බුදුගුණ භාවනාව වැඩීම

iii. අධාර්මික රැකියා

iv. සැරියුත් මහරහතන් වහන්සේ (ලකුණු 5 x 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 08
විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය
පත්‍රය / வினாத்தாள் / Paper: I, II
කාලය / காலம் / Time:

නම / பெயர் / Name: ..........
විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ..........

I කොටස

| අනු අංකය | පිළිතුර | අනු අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 01 | 11 | 01 |
| 02 | 04 | 12 | 02 |
| 03 | 03 | 13 | 04 |
| 04 | 01 | 14 | 02 |
| 05 | 01 | 15 | 03 |
| 06 | 03 | 16 | 04 |
| 07 | 04 | 17 | 01 |
| 08 | 02 | 18 | 01 |
| 09 | 02 | 19 | 02 |
| 10 | 03 | 20 | 03 |

II කොටස

01- i. ජීවිත නොනසමු දේපළ සුරකිමු

ii.
- පාඩම හොඳින් කියවා තේරුම්ගෙන කරුණු රැස්කර ගැනීම.
- අමතර කරුණු වෙනත් පොත්පත් කියවා රැස්කර ගැනීම.
- ගමේ විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගෙන්, දෙමාපිය, වැඩිහිටි අයගෙන් උදව් ලබාගැනීම.
- පැහැදිලි අත් අකුරින් ඡේද බෙදා ලිවීම.
- යෝග්‍ය මාතෘකාවක් යෙදීම.
- ගැළපෙන පින්තූරයක් සුදුසු ලෙස ඇළවීම යනාදි වශයෙන්

iii. මාතෘකාව පාඩමට අදාළ ව යොදා ඇත්නම් ලකුණු පිරිනමන්න.

iv. පෙළ පොත / මල්ලිකා සූත්‍රය ඇතුළත් බණ පොතක් / වෙනත් ධර්ම පුස්තක / අන්තර්ජාලය / යූටියුබ් වැනි සමාජ මාධ්‍යය / බුදුසරණ වැනි පත්තර / සඟරා ආදිය

v. උදව් ලබා ගැනීමට නිසි කෙනෙකු නොසිටීම / නිවැරදි අක්ෂර භාවිත කොට ලිවීම / අදාළ මූලාශ්‍ර සොයා ගැනීමට දුෂ්කර වීම ආදිය.

vi. බිත්ති පුවත්පතකට ලිපියක් ලියන ආකාරය දැනගැනීමට හැකි වීම / මාතෘකාවට අදාළ අමතර දහම් කරුණු දැනගැනීමට හැකි වීම / පරාර්ථකාමී ශිෂ්‍යයෙකු විය යුතු බව අවබෝධ වීම

vii. මල්ලිකා සූත්‍රය

viii. මල්ලිකා බිසව

ix. පොදු දේපළවලට හානි නොකිරීම හා ඒවා සුරක්ෂා කිරීම / පොදු සේවා සපයන ආයතනවලට උපකාර කිරීම/ අසරණයන්ට පිහිට වීම / පාසල් මිතුරු මිතුරියන්ට නොදන්නා හෝ මගහැරුණු පාඩම් ආවරණය කරගැනීමට උදව් කිරීම / තම ආහාරවේල පාසල් මිතුරු මිතුරියන් සමග බෙදාගෙන අනුභව කිරීම / පොත්පත්, නිල ඇඳුම් ආදි පාසල් උපකරණ නොමැති අයට හැකි ලෙස උපකාර කිරීම / අවිහිංසාවාදී ලෙස සැමවිට ම ජීවත් වීම.

x. තමා උපමා කොට අන් අයට හිංසා පීඩා කිරීමෙන් වැළකීම යි.

02. i. සෝ ඉමං ලෝකං පභාසේති අබ්භා මුත්තෝව චන්දිමා

ii. යමකු විසින් කරන ලද පාප කර්මය ඔහු විසින් ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද ඒ තැනැත්තා වලා ගැබෙන් මිදුණු පුන්සඳ මෙන් මේ ලෝකය බබළවයි.

iii. අන් සැමදෙනා සමග හොඳින් කටයුතු කිරීම / දෙමාපියන්ට, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට කීකරු වීම / වැඩිහිටියන්ට ගරු කිරීම / තිදොර සංවර කරගෙන ජීවත් වීම / කුසල කර්ම සිදු කිරීම / දහම් පාසල් අධ්‍යාපනය ලැබීම / අන් අයට හැකි ලෙස උදව් කිරීම ආදිය

03. i. සිරිත් අප විසින් කළ යුතු දේවල් ය. විරිත් අප විසින් නොකළ යුතු දේවල් ය. (වැළකිය යුතු දේවල්)

ii. අකුරු කියවීමක දී, උපන්දින උත්සවයක දී, ගෘහ ප්‍රවේශ මංගල්‍යයක දී, සරණ මංගල්‍යයක දී, පිරිත් පිංකමක දී, දානමය පිංකමක දී, අවමංගල උත්සවයක දී ආදි වශයෙන් බලා ලකුණු දෙන්න.

iii. **අකුරු කියවීම**

අත්පොත් තැබීම නමින් ද හැඳින්වේ. උපතින් වසර තුනක් සම්පූර්ණ වීමේ දී සුභ නැකතකට අනුව මේ චාරිත්‍රය සිදු කරනු ලබයි. නියමිත දිශාවකට දරුවාගේ මුහුණ හරවා සුභ මොහොතින් පොත තබා 'නමෝ බුද්ධාය' යයි කියවා අනතුරුව හෝඩියේ එන අකුරක් දෙකක් ස්වාමීන් වහන්සේ නමක් හෝ දැන උගත් වැඩිහිටියකු ලවා කියවීම හෝ ලිවීම සිදු කෙරේ. ඒ අවස්ථාවට මල් පහන් පිදීම, පන්සිල් සමාදන් කරවීම, තෙරුවන් වැඳීම, සෙත්පිරිත් සජ්ඣායනා කිරීම, දෙවියන්ට පිං අනුමෝදන් කිරීම වැනි චාරිත්‍ර ඉටු කරයි. පැරණි සිරිතට අනුව ගණ දෙවියන්ට හා සරස්වතී දෙවියන්ට කිරිබත්, කැවිලි, පලතුරු පූජා වට්ටියක් තබා ආශීර්වාද ලබා ගනියි. කිරිබතින් බුදුරදුන් හා මහා සංඝරත්නය පිදීම සිදු කෙරේ. බුලත් හුරුල්ලක් පුදා ස්වාමීන් වහන්සේට වැඳ කටයුතු ඇරඹීම ද පැරණි චාරිත්‍රය යි. දැන උගත් වැඩිහිටියන් ලවා මෙය සිදු කෙළේ නම් ඔහුට කිරිබත් ආදියෙන් සංග්‍රහ කිරීම ද චාරිත්‍රයකි.

**උපන්දින උත්සවයක්**

වාර්ෂික ව කෙරෙන චාරිත්‍රයකි. සෙත්පිරිත් දේශනා, බෝධිපූජා, බුද්ධ පූජා, දන්පැන් පූජා පැවැත්වීම උසස් චාරිත්‍ර සේ සැලකේ. ගමේ විහාරස්ථානයට දරුවා රැගෙන යාම ද සිරිතකි. එය සිංහල බෞද්ධ පිළිවෙත යි. ඇතැම්හු මහනුවර දළදා මාලිගාවට ද, අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධියට ද, අටමස්ථානාදියට ද දරුවා රැගෙන යති. අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීමටත්, නිදුක් නිරෝගී සුවපත්, දීර්ඝායුෂ පැතීමත් මින් අපේක්ෂා කෙරේ.

**ගෘහ ප්‍රවේශ මංගල්‍යය**

නිවසක් සාදා එම ගෙට ගෙවදීම මේ නමින් හඳුන්වයි. බුද්ධකාලීන යුගයේ පවා මෙය චාරිත්‍රයක් සේ සිදු කළ බවට සාධක තිබේ. පළමු ව නිවස මනාව පිරිසිදු කොට සුවඳ දුම් අල්ලා කිරි උතුරවනු ලැබේ. පසුව මහා සංඝරත්නය වඩමවා දන් පිළිගැන්වීම සිරිතකි. ඇතැම්හු සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනා ද පවත්වති. තෙරුවන්ගේ ආශිර්වාදය මෙසේ ලබාගෙන දෙවියන්ට හා මිය ගිය ඥාතීන්ට ද පිං අනුමෝදන් කොට නිවසට පැමිණි සියලු දෙනාට බත බුලතින් සංග්‍රහ කිරීම මෙහි අනිවාර්ය සිරිතකි. විශේෂයෙන් ම මද්‍යසාර භාවිතයෙන් වැළකීම මෙහි චාරිත්‍රයකි.

**සරණ මංගල්‍යය**

අඹුසැමි ජීවිතයක ආරම්භය මෙනමින් හැඳින්වේ. ආවාහ විවාහ යන දෙයාකාරයකට මෙය සිදු කෙරේ. නෑනා මස්සිනා විවාහ පැරණි සමාජයේ සිදු වී තිබීම පැරණි චාරිත්‍රයකි. බොහෝවිට සුදුසු නුසුදුසුකම් බලා දෙමාපියන් දරුවන්ට මේ කටයුතු සිදු කර දී ඇත. දරුවන්ගේ කැමැත්තට ද ඉඩ දී ඇත. දෙමාපිය කැමැත්තට පිටින් යාම බෞද්ධ සිරිත නොවේ. මනාලයා හා මනාලියගේ දෙපාර්ශ්වයේ එකඟත්වය මත කේන්දර බලා, ශුභ දිනයක් හා මොහොතක් යොදාගෙන විවාහ ලේකම්වරයකු ලවා විවාහය ලියාපදිංචි කිරීම සිදු කෙරේ. විවාහ මංගල උත්සවයක් යනු මනාලිය මනාලයාගේ නිවසට කැන්දාගෙන පැමිණීම යි. මේ අවස්ථාවේ දී විවිධ සංග්‍රහයන් සිදු වීම ද සිදු වේ. සාම්ප්‍රදායික ව සිදු කෙරෙන පෝරුවේ චාරිත්‍රයක් ද ඇත. එය බෞද්ධ ක්‍රමයට අනුව සිදු කෙරේ. මද්‍යසාරවලින් බැහැර ව මෙම චාරිත්‍ර සිදු කිරීම නියම බෞද්ධ ක්‍රමවේදය යි.

**පිරිත් පිංකම**

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇතුළත් පිරිත් රාත්‍රී කාලයේ ආරම්භ කොට පසුදා පහන් වනතුරු දේශනා කරවා ගැනීම පිරිත් පිංකමක් ලෙස සලකනු ලැබේ. පළමු ව නිවසේ ගෘහමූලිකයා තම ගමේ

විහාරස්ථානයට ගොස් දැහැත් වට්ටියක් දී චාරිත්‍රානුකූල ව ආරාධනා කළ යුතු ය. දිනයක් නියම කරගෙන පැමිණ පිරිත් මණ්ඩපයක් සකස් කෙරේ. ඇතුළත මණ්ඩපයේ ස්වාමීන් වහන්සේලා දොළොස් නමකට වැඩ සිටින ලෙස ආසන පිළියෙල කළ යුතු ය. නියමිත දිනයේ දී ගෙහිමියා විහාරස්ථානයට ගොස් සධාතුක ධාතු කරඬුව හා පිරිත් පොත් වහන්සේ සමඟ ස්වාමීන් වහන්සේලා වඩමවා උන්වහන්සේලාගේ පා දෝවනය කොට ඇතුළත මණ්ඩපයට වඩමවා සම්බුද්ධ පූජාව පූජා කොට ස්වාමීන් වහන්සේලාට ද ගිලන්පස පූජා කෙරේ. අනතුරුව දැහැත් වට්ටියක් පුදා ආරාධනා කිරීමෙන් පසුව පන්සිල් සමාදන් වී ආශීර්වාදය පිණිස ආරක්ෂක පිරිත් දේශනාව තුන්යම් රාත්‍රියක් පුරාවට ම දේශනා කිරීම මහා සංඝරත්නය විසින් සිදු කරනු ලබයි. අවසානයේ සෙත් පිරිත් දේශනා ද දේශනා කරන ස්වාමීන් වහන්සේලා ගිහි පිරිසට පිරිත් පැන් දී පිරිත් නූල් ලබා දීම සිදු කරති. උදෑසන මහා සංඝරත්නයට දන්පැන් පූජාවක් ද කොට පැමිණි පිරිසට සංග්‍රහ කිරීම ද සිදු කෙරේ. මේ කිසිදු තැනක දී මද්‍යසාර භාවිත නොකිරීම බෞද්ධ සිරිත යි.

**අවමංගල චාරිත්‍ර**

මියගිය අය වෙනුවෙන් කරනු ලබන අවසාන චාරිත්‍ර කටයුතු මෙනමින් කියැවේ. මිය ගිය කල්හි සුදු වැල් එල්ලීම සිරිතකි. රාත්‍රී කාලයට සතිපට්ඨාන සූත්‍ර දේශනාව හෝ වෙස්සන්තර ජාතකය කියවීම පැරණි චාරිත්‍රයකි. විනෝද ක්‍රීඩා සිදු කිරීම බෞද්ධ චාරිත්‍රය නොවේ. මළගෙදර සියලු දෙනා සුදු ඇඳුමින් සැරසීම සිරිතකි. මද්‍යසාරවලින් තොරව පැමිණෙන්නන්ට ආහාරපානවලින් සංග්‍රහ කිරීම සිරිතකි. අවමංගල චාරිත්‍ර සඳහා ස්වාමීන් වහන්සේලා වඩමවා මතක වස්ත්‍ර දැහැත් ගිලන්පස පිළිගන්වා මිය ගිය අයගේ ගුණ සිහිපත් කොට පැන් වඩා පිං අනුමෝදන් කිරීම සිදු කෙරේ. මහසඟරුවන 'අනිච්චා වත සංඛාරා' යන අනිත්‍ය මෙනෙහි කරන ගාථාව සජ්ඣායනා කිරීම සිදු කරති. ගමේ සමිති සමාගම්වල පිරිස් විසින් ද මිය ගිය තැනැත්තාගේ ගුණ වැයීමක් කෙටියෙන් සිදු කරනු ලැබේ. දේහය සුසාන භූමිය වෙත ගෙන ගොස් ආදාහනය හෝ භූමදානය සිදු කෙරේ. දින සතක් ගතවන තැන ධර්ම දේශනාවක් පවත්වා දානමය පිංකමක් සිදු කිරීම ද මෙහි ම එක් චාරිත්‍රයකි.

04- i. සිගාලෝවාද සූත්‍රය / සිගාලක ගෘහපති පුත්‍රයාට

ii. සම්මාන කිරීම, අවමන් නොකිරීම, වෙනත් කාන්තාවන් කරා නොයාම, වගකීම් පවරා දීම, ඇඳුම් පැළඳුම් ලබා දීම.

iii. ප්‍රමාද වන තම මිතුරා රැක ගැනීම (යහ මගට ගැනීම), මිතුරාගේ ධනය රැක ගැනීම, බියක් පැමිණි විට මිතුරාට පිහිට වීම, ආපදාවන්හි දී හැර නොයාම, මිතුරාගේ දරු මුණුබුරන් ද ආරක්ෂා කිරීම, අනතුරුවලින් බේරා ගැනීම, මිතුරා යහපත් කටයුතුවල යෙදවීම, මිතුරා සමඟ එකතු වී පින් දහම් කිරීම ආදි වශයෙන් ලියා ඇති පිළිතුරු බලා ලකුණු දෙන්න.

05. i. දම්සක් පැවතුම් සූත්‍රය (ධම්මචක්කපවත්තන සූත්‍රය)

ii. ජාතිය හෙවත් ඉපදීම, ජරාව හෙවත් වයස්ගත වීම, ව්‍යාධිය හෙවත් රෝගපීඩාවලට ලක්වීම, මරණය හෙවත් ජීවිතයේ අවසානය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දේ නොලැබීම, කෙටියෙන් ම උපාදාන ස්කන්ධ පහ ම දුක් සහගත වීම.

iii. **ජාතිය හෙවත් ඉපදීම**

සත්ත්වයෝ මිනිස්, තිරිසන් ආදි වශයෙන් විවිධ සත්ත්ව කොට්ඨාසවල උපදිති. ඉපදීම යනු ඒ ඒ භවවල පහළ වීමයි. දරුවෙක් මව් කුස සිට විවිධ පීඩාවන්ට ගොදුරු වේ. එනමුත් ඒවා වටහා ගන්නේ එය දුකක් ම බව දැනෙන අවස්ථාවක දී ය. මෙසේ නැවත නැවත ඉපදීම නිසා මේ දුක හටගනී. උපතක් නැති කල දුකක් නැත.

**ජරාව හෙවත් වයස්ගත වීම**

වයස්ගත වීම ස්වාභාවික ව සිදු වන්නකි. එය දිරා යාම ලෙස ද හැඳින්විය හැකි ය. කෙස් පැහීම, දත් වැටීම, ඇඟ රැලි වැටීම, ඇස් කන් ආදි ඉඳුරන් දුබල වීම ආදි වශයෙන් ශාරීරික වෙනස්කම් ඇති වීම දුකකි. කිසිවෙකු කැමැත්තක් නොදක්වන්නකි. ශාරීරික දුබල වීම ක්‍රමයෙන් මානසික දුබලත්වයට ද හේතු වේ. එය මහා දුකකි.

**ව්‍යාධිය හෙවත් රෝගපීඩාවලට ලක්වීම**

බුදුරජාණන් වහන්සේ විසින් විවිධ රෝග පීඩාදීන් පිළිබඳ පෙන්වා දී ඇත. හිසරදය, අතපය රිදීමක් ආදි සුලු අසනීපයක් සෑදුණ ද දුකක් ඇති වේ. බරපතල ලෙඩරෝගවලදී සත්ත්වයා ඉතා දැඩි ලෙස දුකට පත් වේ. කායික හා මානසික යන දෙයාකාරයෙන් ම මෙසේ පීඩාවන්ට ලක්වීම දුකකි.

**මරණය හෙවත් ජීවිතයේ අවසානය**

මරණය යනු එක් භවයක ජීවිතය අවසන් වීම යි. පංචස්කන්ධය බිඳ වැටීම යි. සත්ත්වයාගේ මරණය සතරාකාරයකින් සිදු වේ. ආයුක්ඛය මරණය (ආයුෂය ගෙවී යාමෙන් සිදුවන මරණය) කම්මක්ඛය මරණය (කර්ම ශක්තිය ගෙවී යාමෙන් සිදුවන මරණය) උභයක්ඛය මරණය (ආයුෂයත් කර්ම ශක්තියත් දෙක ම ගෙවී යාමෙන් සිදුවන මරණය) උපච්ඡේදක මරණය (බාහිර උපද්‍රවයකින් සිදුවන මරණය) යනුවෙනි. මරණය අප නොපතන බැවින් එය දුකක් ම වේ.

**අප්‍රියයන් හා එක්වීම**

අකමැති පුද්ගලයන් හා වස්තූන් සමග එක් වීමට සිදුවීම දුකකි. එකට වාසය කිරීමට හෝ හමුවීමට සිදුවීම දුකකි. (ලියා ඇති විස්තර බලා ලකුණු දෙන්න.)

**ප්‍රියයන්ගෙන් වෙන්වීම**

තමන්ට හිතැති ආදරය සෙනෙහස දක්වන කැමැති පුද්ගලයන් හෝ වස්තූන් තමන්ට අහිමි වී යාම දුකකි. දෙමාපියන්, පවුලේ ඥාතීන්, ගුරුවරුන්, හිතවතුන් ආදි එවැනි අය අහිමි වීම දරාගැනීමට අපහසු දෙයකි.

**කැමති දේ නොලැබීම**

සසර ඉපදීමට අකමැති වුවත් එය සිදු නොවන නිසා බුද්ධ දේශනාවට අනුව එය දුකකි. මහලු නොසිටීමට කැමැති වුවත් එය සිදු නොවීම දුකකි. රෝගවලට ගොදුරු වීමට අකමැති වුවත් එය ඉටු නොවීම දුකකි. නොමැරී සිටීමට අවශ්‍ය වුවත් එය ඉටු නොවීම දුකකි. තමන් අපේක්ෂා කරන යමක් වේ නම් එය නොලැබීම දුකකි.

**(කෙටියෙන්ම) පංචස්කන්ධය ම දුකක් වීම**

රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධය ම දුකකි. ස්කන්ධ පහට ආශා ඇති කරගැනීම පංච උපාදානය යි. මගේ ය, මම වෙමි, මගේ ආත්මය යැයි සිතින් අල්ලා ගැනීම දුකකි. දුක් සහගත වන්නේ එසේ උපාදාන කරගැනීම මිස පංචස්කන්ධය නොවේ.

06. i. තව්තිසා දෙව්ලොව, සිළුමිණි සෑය, නාග ලෝකය, ගන්ධාර දේශය, කාලිංග දේශය

ii. දෛනික පූජා (දිනපතා පවත්වන පුද පූජා)

සප්තාහික පූජා (සතියකට වරක් පවත්වන පුද පූජා)

වාර්ෂික පුද පූජා (වසරකට වරක් පවත්වන පුද පූජා)

iii. ලක්දිවට වැඩම කරවා ඇත්තේ වම් දළදා වහන්සේ ය. ඒ පිළිබඳ පාලි දාඨාවංසයෙහි විස්තර සඳහන් ය. ඛේම මහරහතන් වහන්සේ මෙම වම් දළදා වහන්සේ බුදුන් වහන්සේගේ ආදාහන මළුවෙන් ගෙන කළිඟු රට දන්ත පුරයෙහි බ්‍රහ්මදත්ත රජුට ලබා දී ඇත. රජු එය දළදා මැඳුරක තැන්පත් කොට පුද පූජා පවත්වා ඇත. ඉන්පසු එම රජුගේ පරපුරේ රජවරුන් පිළිවෙළින් පුද පූජා දක්වා ඇත. පසුකාලීන ව රජ වූ ගුහසීව රජතුමා බීරධාර නම් රජෙකු සමග යුද්ධයකට සම්බන්ධ වීමට සිදු වූයෙන් එම දළදා වහන්සේ තම දියණිය වූ හේමමාලා කුමරියටත් බෑණනුවන් වූ දන්ත කුමරුටත් ලබා දී තමන් යුද්ධයෙන් පැරදුණහොත් එම දළදා වහන්සේ ලක්දිව මහාසේන රජුට ලබා දෙන ලෙස ඉල්ලා සිට ඇත. ඒ අනුව එම දෙදෙනා විසින් ඉන් ටික කලකට පසු ලක්දිව රජ කළ කිත්සිරමෙවන් රජු දවස ලක්දිවට ගොඩබැස රජුට එම දළදා වහන්සේ ලබා දී ඇත. පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑකල, බෙලිගල, දෙල්ගමුව, කෝට්ටේ ආදි විවිධ ස්ථානවල ආරක්ෂාව පිණිස තැන්පත් කොට අද වනවිට මහනුවර දළදා මාලිගාවේ එම දළදා වහන්සේ වැඩ සිටී.

07. i. **බුදුරජාණන් වහන්සේගේ ආගන්තුක සත්කාරය**

තමන් හමුවීමට එන තැනැත්තා කවරෙකු වුවත් ආගන්තුකයකු වශයෙන් ඔහු සුහද ව පිළිගෙන සත්කාර කිරීම පරමාදර්ශී ගුණයකි. එලෙස බුදුන් වහන්සේ හමුවීමට රජුන්, බමුණන්, සිටුවරුන්, මෙන්ම දුකට පත් අය ද පැමිණ ඇත. විවිධ අය විවිධ අරමුණු මත පැමිණ තිබුණ අතර ඇතැමුන් බුදුරජාණන් වහන්සේ අපහසුතාවයට පත් කිරීමට ද පැමිණ ඇත. ඒ සියලු දෙනාට අර්ථයෙන් ධර්මයෙන් උන්වහන්සේ අනුශාසනා කොට ඇත.

උදා ශාක්‍ය ජනපදයෙහි මේදතළුම්ප ගමේ වැඩ සිටිය දී **පසේනදී කොසොල් රජු** බුදුරජාණන් වහන්සේ ම දොර විවර කොට එතුමා ව පිළිගැනීම හා රජතුමා එය අගය කිරීම / **සෝණදණ්ඩ බමුණා** බුදුන් වහන්සේ ඉතා උණුසුම්ව කෙනෙකු පිළිගන්නා බවත් සතුටු සාමීචියෙහි යෙදෙන බවත්

ආදී වශයෙන් අගය කිරීම / **අනාථපිණ්ඩික සිටුවරයාට** පළමුවර දී ම නම කියා ම ආමන්ත්‍රණය කොට පිළිගැනීමෙන් සතුටට පත්වීම / පිරිනිවන් මංචකයේ වැඩ සිටිය දී **සුභද්‍ර පිරිවැජියාව** තමන් සමීපයට ඒමට ඉඩ ලබාදෙන ලෙස ආනන්ද හිමියන්ට පැවසීම.

ii. **බුදුගුණ භාවනාව වැඩීම**

බුදුරජාණන් වහන්සේගේ ගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව යි. එය බුද්ධානුස්සති භාවනාව යනුවෙන් ද හැඳින්වේ. මත්ත මානවකයාට දෙව්ලොව උපත ලැබීමට ද බුදුගුණ සිහි කිරීම හේතු විය. බුදුගුණ භාවනාවේ ආනිශංස ද බොහෝ ඇත. (බුදුරජාණන් වහන්සේ පිළිබඳ අසීමිත පැහැදීමක් ඇති වීම, පාපයට බියක් හා ලැජ්ජාවක් ඇති වීම, කෙලෙස් යටපත් වීම, නිරාමිස සතුටක් ලැබීම, කායික හා මානසික සංවරය ඇති වීම, නපුරු සිහින නොදැකීම, සිත සන්සුන් වීම යනාදි වශයෙනි.)

භාවනාව වඩන ආකාරය

**පියවර 1**

මුව දොවා දැත් පිරිසිදු කොට පිරිසිදු ඇඳුමකින් සැරසෙන්න.

**පියවර 2**

සමාධි බුද්ධ ප්‍රතිමාවක් ඉදිරිපිට මල් පහන් පුදා පන්සිල් සමාදන් ව බුද්ධ වන්දනයේ යෙදෙන්න.

**පියවර 3**

බුද්ධ ප්‍රතිමාව ඉදිරිපිට පිරිමි හෝ කාන්තා වශයෙන් සුදුසු ලෙස අර්ධ පර්යංකයෙන් හෝ බද්ධ පර්යංකයෙන් වාඩිවෙන්න.

**පියවර 4**

උඩුකය සෘජුව තබාගෙන වම් අත්ල මත දකුණු අත්ල තබාගෙන හොඳ හුස්මක් ගෙන පිට කර බුදුරුව දෙස හොඳින් බලමින් බුදුරුව දර්ශනය වන තෙක් ඇස් ඇර මෙන් ම දැස් වසාගෙන ද මෙනෙහි කරමින් භාවනාවේ යෙදෙන්න.

**පියවර 5**

දැස් වසාගෙන ඉදිරියේ බුදුරුව දර්ශනය කරගෙන 'නෙත සැලසිල්ල බුදු හිමි රුව දැකීම ය' යන කවිය තාලයට සිතින් සජ්ඣායනා කරමින් බුදුරුව මෙනෙහි කරන්න. මුල දී එක් එක් ගුණය මෙනෙහි කර පසුව වර්ධනය කරගැනීමෙන් පසු නව අරහාදී බුදුගුණ ම මෙනෙහි කළ හැකි ය.

(iii) **අධාර්මික රැකියා**

අධාර්මික රැකියා පහක් පිළිබඳ ව සඳහන් වේ. අවි ආයුධ වෙළඳාම, සත්ත්ව වෙළඳාම, මස් වෙළඳාම, මත් ද්‍රව්‍ය වෙළඳාම හා වසවිස වෙළඳාම යි. අනෙකුත් ඕනෑම රැකියාවක් ද අධාර්මික ලෙසින් සිදු කළ හැකි බව ද දහමේ සඳහන් වේ. එසේ නොකොට දැහැමි ව රැකියා කොට ධනය ඉපයිය යුතු බව බුදු දහම උගන්වයි. (මේ පිළිබඳ වන විස්තරයක් සඳහා සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)

(iv) **සැරියුත් මහරහතන් වහන්සේ**

ගිහි නම වූයේ උපතිස්ස ය. මහාසාර බමුණු කුලයක සාරි බැමිණියට දාව ඉපදුණේ ය. හොඳම මිතුරා කෝලිත ය. දෙදෙනා එක්ව 'ගිරග්ගසමජ්ජ' නම් සැණකෙළියක් බලා ජීවිත කලකිරීමකට පත්ව සත්‍යය සොයා ගියහ. සංජය පිරිවැජියා සමීපයේ පැවිදි වී දහම ඉගෙන ගත්ත ද තමන් සොයන දහම නොමැති බව වටහාගෙන එතැනින් ඉවත් ව දෙදෙනා එක්ව වෙන වෙන ම සත්‍යය සොයා යාමේ දී අස්සජි මහරහතන් වහන්සේගෙන් දහම් අසා සෝවාන් ඵලයට පත්ව තම මිතුරාට ද එම දහම කියා දී දෙදෙනා ම පැවිදි වූ අතර උපතිස්ස පිරිවැජියා 'සාරිපුත්ත' යන නම ලැබී ය. පැවිද්දෙන් දෙසතියකට පසුව උන්වහන්සේ 'දීඝනඛ' පිරිවැජියාට බුදුරජාණන් වහන්සේ දේශනා කරමින් සිටි 'වේදනා පරිග්ගහ' සූත්‍රය අසා රහත් බව ලබා ගෙන ප්‍රථම සංඝ සන්නිපාතයේ දී අගසව් තනතුර ද ලබා ගත්හ.

ගුණාංග - අසීමිත ගුරු ගෞරවය, කළගුණ දැක්වීම, නිහතමානී බව, තම කාර්යය මැනවින් ඉටු කිරීම. (මේ පිළිබඳ වන විස්තරයක් සඳහා සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
2024
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න